**ශීර්ෂය 257 - කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 24 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 25 ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන ලද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට අනුව භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් ලෙස රු.5,233,258,423 ක් දක්වා තිබුණ ද මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබුණු 2022 වර්ෂය සඳහා අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශයට අනුව භාණ්ඩාගාරයෙන් අග්‍රිම ලැබීම් වටිනාකම රු.4,920,762,000 ක් වූයෙන් එම වටිනාකම් අතර රු.312,496,423ක නොසැසදීමක් නිරීක්ෂණය විය. | මූල්‍ය ප්‍රකාශන වල ඒසීඒ - 3 අනුව සඳහන් භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් වටිනාකම නිවැරදිබව, එම වටිනාකම භාණ්ඩාගාර ප්‍රේෂණ මුදල හා ගැලපීමේදී 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ශේෂය කෙරෙහි බලපෑමක් සිදු වී නොමැති බව. | නොසැසදීම් සඳහා සැසදීම් ප්‍රකාශ පිළියෙල කර ඉදිරිපත්කල යුතු අතර නොසැසදීම් නිවැරදි කිරීමට හා ඉදිරියේදී මෙවැනි අඩුපාඩු වලක්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

**මූල්‍ය නොවන වත්කම්**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබුණු ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් මූල්‍ය නොවන වත්කම් 08 ක අවසන් ශේෂයන්, 2022 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබුණු සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන වල මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයට අනුව (ACA-6/SA 82) එකී වත්කම්වල ආරම්භක ශේෂ එකතුව සමඟ සැසඳීමේදී රු.310,597,605 ක වටිනාකමක නොසැසඳීමක් නිරීක්ෂණය විය. | 2022 වර්ෂයේ භාණ්ඩාගාර මුද්‍රිත ප්‍රකාශයේ ආරම්භක ශේෂය ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකක පෙන්වූයේ වැරදි වටිනාකමකි. WEB UPLOAD වීමේදී ඇති වූ තාක්ෂණික දෝෂයන් හේතුවෙන් එම වැරදි අගය පෙන්වා තිබුණි. 2022 වර්ෂයේදී එම වැරදි අගයන් නිවැරදි කිරීමට භාණ්ඩාගාරය මඟින් කටයුතු කළ බැවින් 2022 දෙසැම්බර් 31 දිනට SA 82 වාර්තාවේ දැක්වෙන අවසාන ශේෂය නිවැරදි අගයක් බව. | නොසැසදීම් සඳහා සැසදීම් ප්‍රකාශ පිළියෙල කර ඉදිරිපත්කල යුතු අතර නොසැසදීම් නිවැරදි කිරීමට හා ඉදිරියේදී මෙවැනි අඩුපාඩු වලක්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2022 දෙසැම්බර් 31 දිනට සිගාස් (CIGAS) වැඩසටහන අනුව වූ මූල්‍ය නොවන වත්කම් සංචලන වාර්තාව ප්‍රකාරව සමාලෝචිත වර්ෂය අවසානයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 හි කෙරීගෙන යන වැඩ වටිනාකම රු.388,756,237 වුවද, මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයට (ACA-6 ප්‍රකාශය) අනුව එදිනට කෙරීගෙන යන වැඩ වටිනාකම රු.275,762,780 වුයෙන්, එකී ශේෂ අතර රු.112,993,457 ක වටිනාකමකින් නොසැසඳීමක් නිරීක්ෂණය විය. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දත්ත ඇතුලත් ඒකාබද්ධ ගිණුම් සාරාංශයෙන් ජනනය වන වාර්තාවේ ස්ථාවර වත්කම් වටිනාකම් නිවැරදිව සටහන් නොවන බව පිළිගනිමි. මේ පිළිබඳව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවද දැනුවත් කරන ලදි. කෙරීගෙන යන වැඩ (WIP) වල වටිනාකම ද මේ හේතුවෙන් වෙනස්කම් පෙන්වන බව පිළිගනිමි. | නොසැසඳීම් සඳහා සැසඳීම් ප්‍රකාශ පිළියෙල කර ඉදිරිපත්කල යුතු අතර නොසැසඳීම් නිවැරදි කිරීමට හා ඉදිරියේදී මෙවැනි අඩුපාඩු වලක්වා ගැනීමටට කටයුතු කළ යුතුය. |
| (ඇ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය නොවන වත්කම් උප ලේඛනයට අනුව වර්ෂය තුළ මිලදී ගත් හා අපහරණය කරන ලද මූල්‍ය නොවන වත්කම්වල එකතුව පිළිවෙලින් රු.50,848,337 ක් හා රු.6,275,253 ක් වුවද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් වාර්තාවේ මිලදී ගැනීම් හා ඉවත් කිරීම් යටතේ එකී වටිනාකම් ඇතුළත් කර නොතිබුණි. | භාණ්ඩාගාරය මඟින් ඉහත (අ) හි මෙම වෙනස නිවැරදි කිරීමට කටයුතු කල බැවින් වර්ෂය තුල මිලදී ගැනීම් හා අපහරණයන් ඇතුලත් නොවී වෙනස සඳහා ගැලපුම් කර අවසාන ශේෂය නිවැරදි කර ඇති බව. | මෙකී ගැලපීම් මූල්‍ය නොවන වත්කම් වාර්තාවේ මිලදී ගැනීම් හා ඉවත් කිරීම් යටතේ ඇතුළත් කළ යුතුය. |
| (ඈ) | 2022 ජනවාරි 01 දිනට භාණ්ඩාගාර වගු SA 82 හි පරිදි මූල්‍ය නොවන වත්කම් වාර්තාවේ රු.53,190,718 ක ආරම්භක ශේෂ සඳහා ගැලපුම්වලට අදාල අනුමැතීන් හා ඒවාට අදාල ජ'නල් සටහන් සහ උපලේඛන විගණනයට ඉදිරිපත් නොවුණි. | වත්කම් සඳහා ගැලපීම් සිදු කරන්නේ අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් බව, එම ගැලපුම් වලට අදාල අනුමැතීන් හා උපලේඛන එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතුව පවතින අතර ඒවා මින් ඉදිරියේදී ප්‍රධාන කාර්යාලයටද ගෙන්වා ගොනු කර ගැනීමට කටයුතු කරන බව. | ආරම්භක ශේෂ සඳහා වන ගැලපුම්වලට අදාල අනුමැතීන්, ජ'නල් සටහන් සහ උපලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල මූල්‍ය නොවන වත්කම් වාර්තාවේ කෙරීගෙන යන වැඩ ලෙස දක්වා ඇති එකතුව රු.153,768,738 ක වටිනාකමකින් යුතු නව කාර්යාල ගොඩනැගිලි කාර්යාල කටයුතු සඳහා 2020 සිට 2022 දක්වා වර්ෂවල සිටම භාවිතා කරමින් පැවතිය ද 2022 දෙසැම්බර් 31 දිනටත් කෙරීගෙන යන වැඩ යටතේ තවදුරටත් දක්වා තිබුණි. | මෙහි දක්වා ඇති කාර්යාල ගොඩනැගිලි මේ වන විට වැඩ නිම වී ඇති ගොඩනැගිලි වන බැවින් එම ගොඩනැගිලි වටිනාකම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගොඩනැගිලි යටතට ඇතුලත් කර ප්‍රා.ලේ කාර්යාලය වෙත මාරු කිරීමට කටයුතු කරන බව. | වැඩ නිම වී ඇති ගොඩනැගිලි තවදුරටත් කෙරීගෙන යන වැඩ යටතේ නොදක්වා ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කළ යුතුය. |

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව, කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරී අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය තුල මූල්‍ය පාලනය හා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වා ගෙන යාම සඳහා අභ්‍යන්තර පාලන ක්‍රමවේද ක්‍රියාත්මක වනු ලබන අතර වරින් වර තවදුරටත් වැඩි දියුණු කල යුතු පද්ධතීන් හඳුනා ගෙන ඒ සඳහා අභ්‍යන්තර පාලන ක්‍රමවේද අළුතින් හඳුන්වා දීම අවස්ථානුකූලව සිදුකරනු ලබන බව, ඉදිරියේදි තවදුරටත් වැඩි දියුණු කල යුතු පද්ධතීන් හඳුනා ගෙන ඒ සඳහා අභ්‍යන්තර පාලන ක්‍රමවේද අළුතින් හඳුන්වා දීම සටහන් කර ගත් බව . | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

### 2.2 නිති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරී අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| (අ) | මුදල් රෙගුලාසි 396 (ඇ) | 1,786,752 | 2022 දෙසැම්බර් 31 දිනට බැංකු ගිණුම් 05 කින් නිකුත් කර තිබූ වටිනාකම රු.1,786,752 ක්වූ කල් ඉකුත් වී මාස 01 ත් මාස | මාස 06 ඉකුත්වීමට පෙර චෙක්පත නිරවුල් කර ගැනීමට | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | 14 ත් අතර කාල පරාසයක් සහිත චෙක්පත් 17 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | කටයුතු කරන ලෙස අදාල ආයතන ඇනුවත් කරන බව. | |
| (ආ) | 2019 මැයි 31 දිනැති අංක 14/2019 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | පානදුර හා හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 හි විශ්‍රාම වැටුප් ලිපි ගොනු 117 ක් 2022 දෙසැම්බර් 31 දිනටත් චක්‍රලේඛය ප්‍රකාරව සංශෝධනය කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු බව හා එසේ නොකල නිලධාරීන් සම්බන්ධයෙන් අදාල පරිදි විනයානුකූලව කටයුතු කිරීම. |
| (ඇ) | 2019 මැයි 30 දිනැති අංක 02/2019 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපිය, 06 ඡේදය | 5,179,949 | මිය ගිය විශ්‍රාමිකයන්ගේ තොරතුරු කාලීනව ලබාගෙන විශ්‍රාම වැටුප් ලබන්නන්ගේ නාමලේඛනය කලින් කලට යාවත්කාලීන නොකිරීම මත පානදුර, බේරුවල, හොරණ හා ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල 2022 දෙසැම්බර් 31 දිනට මිය ගිය විශ්‍රාමිකයන් වෙනුවෙන් අවිධිමත් ලෙස වැඩිපුර ගෙවීම් කර තවදුරටත් අයකර ගත යුතු රු.5,179,949 ක මුදලක් පැවතුණි. | මේ පිළිබඳව මරණ සහතික නිකුත් කරන රෙජිස්ට්‍රාර්වරුන් ගේ විශේෂ අවධානය යොමු කිරීමට අපේක්ෂා කරන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු බව හා එසේ නොකල නිලධාරීන් සම්බන්ධයෙන් අදාල පරිදි විනයානුකූලව කටයුතු කිරීම. |
| (ඈ) | 1996 අංක 22 දරන පනත මගින් සංශෝධනය කරන ලද 1916 අංක 33 දරන (182 අධිකාරිය වන) තුවක්කු ආඥා පනත හා 2020 අගෝස්තු 26 දිනැති අංක 06/2020 දරණ ආරක්ෂක අමාත්‍යාංශ චක්‍රලේඛය | | | | |

| | | | |
|---|---|---|---|
| (i) 5(1), 22(1), 22(2)(උ), 23(1) හා 23(3) වගන්ති හා චක්‍රලේඛයේ 3.4 වගන්තිය | බලපත්‍ර අලුත් කිරීමකින් තොරව හා එම ගිනිඅවි තාවකාලිකව භාරදීමකින් තොරව හොරණ හා පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පිළිවෙලින් ගිනි අවි 15 ක් හා 22 ක් පුද්ගලයන් විසින් සන්තකයේ තබා ගෙන ඇති බවත් ඒවා අතරින් හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගිනි අවි 12 ක් වසර 10 සිට 20 දක්වා කාල සීමාවකින් ද පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලේයේ ගිනි අවි 20 ක් වසර 06 සිට 10 දක්වා කාල සීමාවකින් ද බලපත්‍ර අළුත් කළ බවට සාක්ෂි ඉදිරිපත් නොවීය. | දක්වා ඇති ගිනි අවි සම්බන්ධයෙන් පොලිස් අධිකාරී පානදුර හා හොරණ, වෙතින්ද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින්ද වාර්තා කැඳවා ඇති බව හා ඒ අනුව ලැබී ඇති වාර්තා පදනම් කරගෙන ඒ සම්බන්ධව ක්‍රියා කරමින් පවතීන බව. | පනතේ හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව හා එසේ කටයුතු නොකරන නිලධාරීන් සම්බන්ධයෙන් අදාල පරිදි විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීම. |
| (ii) චක්‍රලේඛයේ 3.6 වගන්තිය | ගිනිඅවි බලපත්‍ර අලුත්කිරීමේදී ගිනි අවියේ අවශ්‍යතාවය තවදුරටත් පවතින බවට තහවුරු කරගැනීම සඳහා අදාල වගාඉඩම්, සත්ත්ව ගොවිපළවල පැවතීම පිළිබඳව පත්ඉරු හෝ සහතික කළ ඡායා පිටපත් ලබාගත යුතු වුවද නියැදි පරීක්ෂාවට ලක්වූ හොරණ, පානදුර හා ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල එලෙස කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත්කර නොතිබුණි. | පනතේ හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව හා එසේ කටයුතු නොකරන නිලධාරීන් සම්බන්ධයෙන් අදාල පරිදි විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීම |
| (iii) චක්‍රලේඛයේ 4.1 වගන්තිය | වයස අවුරුදු 65-70 අතර පුද්ගලයින් සඳහා ගිනි අවියක් භාවිතා කිරීමට සුදුසු කායික හා මානසික තත්වයකින් පසුවන බවට රජයේ පිළිගත් වෛද්‍යවරයකුගෙන් ලබාගත් වෛද්‍ය සහතිකයක් නොමැතිව නියැදි පරීක්ෂාවට ලක්වූ, පානදුර හා ඉංගිරිය ප්‍රා.ලේ. කාර්යාල විසින් 2023 වර්ෂයේ පුද්ගලයින් 09 දෙනෙකු සඳහා ගිනිඅවි බලපත්‍ර ලබාගැනීමට නිර්දේශ ලබාදී තිබුණි. | ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් වයස අවු 65-70 දක්වා බලපත්‍රලාභීන් විධිමත් වෛද්‍ය සහතික ඉදිරිපත් කර ඇති බව. | පනතේ හා චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව හා එසේ කටයුතු නොකරන නිලධාරීන් සම්බන්ධයෙන් අදාල පරිදි විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීම. |

## 2.3 තැන්පතු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට, පොදු තැන්පත් ගිණුම් 6 ක එකතුව රු.345,324,668 ක ශේෂයක් පැවති අතර එම ශේෂය තුළ පොදු තැන්පත් ගිණුම් 5 කට අදාළව එකතුව රු. 96,328,508 ක් වූ වසර දෙකක් ඉක්මවා තිබූ නිරවුල් කර නොතිබූ තැන්පතු ශේෂයක් හා එකතුව රු.18,141,909 ක් වූ වසර 5 ක් ඉක්ම වූ තැන්පතු ද පැවතුණි. මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571(3) විධිවිධාන ප්‍රකාරව පවතින අඩුපාඩු හා දෝෂ නිවැරදි කර අදාළ පාර්ශව වෙත තැන්පත් මුදල් ගෙවා දැමීම හෝ රජයේ ආදායමට බැර කිරීමට හෝ විධිමත් පියවර ගෙන නොතිබුණි. | වසර 05 ක් ඉක්මවූ පොදු තැන්පත් සම්බන්ධව විගණන කමිටුවලදී නිරන්තරයෙන් සාකච්ඡා සිදුකරන අතර එමඟින් ගැටළු සහගත තැන්පත් වලට විසඳුම් ලබා ගැනීම මඟින් තැන්පත් ශේෂ නිරවුල් කර ඇති බව හා ප්‍රාදේශීය ලේකම්වරුන් මේ පිළිබඳ දැනුවත් කරන ලද බව. | කල් ඉකුත් වූ තැන්පතු ශේෂ කඩිනමින් නිරවුල් කිරීම හෝ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීම. |

## 2.4 අනාර්ථික ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජනාධිපති කාර්යාල වැය ශීර්ෂය යටතේ ප්‍රතිපාදන වෙන්කර 2018 හා 2019 වර්ෂවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ක්‍රියාත්මක කර තිබුණු දිළිදුකම තුරන් කිරීමේ පරමාර්ථය පෙරදැරි කරගත් ග්‍රාම ශක්ති ජනතා වැඩසටහන යටතේ සමිති 140 ක් ලියාපදිංචි කර තිබූ අතර 2022 දෙසැම්බර් 31 දිනට ඉන් සමිති 103 ක් එනම්, සමිතිවලින් සියයට 74 ක්ම අක්‍රියව පැවති අතර, එකී සමිතිවල බැංකු ගිණුම්වල එදිනට පැවති රු.55,754,971 ක මුදලක් ද අදාල වැඩසටහනට යොදා නොගෙන නිශ්කාර්යව පැවතුණි. | ග්‍රාම ශක්ති කාර්යාංශය 2019 වර්ෂයේ සිට සමෘද්ධි සංවර්ධන අමාත්‍යාංශය වෙත අනුයුක්ත කල අතර 2020,2021 හා 2022 යන වර්ෂ වලදී ග්‍රාම ශක්ති වැඩසටහන ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳව නිසි උපදෙස් නොලැබුණු බව. | නිසි උපදෙස් වගකිවයුතු පාර්ශවයන්ගෙන් ලබාගෙන වැඩසටහන ක්‍රියාත්මක කල යුතුය. |
| (ආ) | කළුතර දිස්ත්‍රික්කය තුලවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල බොහොමයක අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සංවර්ධන නිලධාරීන් සේවයේ යොදවා සිටි අතර නියැදි පරීක්ෂාවට ලක්වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල පහක (05) එලෙස අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සේවයේ යොදවා සිටි අතිරික්ත සංවර්ධන නිලධාරීන් අසූ දෙනෙකු (80) වෙනුවෙන් 2022 ජනවාරි සිට 2023 ජනවාරි | රජයේ ප්‍රතිපත්තියක් මත ගන්නා ලද තීරණයක් අනුව එම නිලධාරීන් බඳවාගෙන අනුයුක්ත කර ඇති බව . | අනුමත කාර්ය මණ්ඩලය තුල තනතුරු පවත්වාගෙන යා යුතු අතර නැතහොත් අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කරවා ගතයුතුය. |

දක්වාවූ කාලසීමාව වෙනුවෙන් පමණක් වැටුප් වශයෙන් රු.50.745.984 ක් ගෙවා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණ ද 2014 පෙබරවාරි 17 දිනැති අංක 1/2014 දරන චක්‍රලේඛයේ හා 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිලියෙල කිරීමේදී ඇතුළත් විය යුතු විස්තරාත්මක තොරතුරු ඇතුළත් කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | ක්‍රියාකාරී සැලැස්ම 2014 පෙබරවාරි 17 දිනැති අංක 1/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව සකස් කරන ලෙස අදාල නිලධාරීන් දැනුවත් කරන ලද බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළයුතු බව. |

### 3.2 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කළුතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම 2017 පෙබරවාරි 13 දින ආරම්භ කළ ද කොන්ත්‍රාත්කරු ඉදිකිරීම් කටයුතු අතරමඟ නවතා දැමීමේ හේතුවෙන් 2018 අගෝස්තු මස ඉදිකිරීම් කටයුතු සම්පූර්ණයෙන්ම නැවතී තිබුණි. නැවතත් 2020 වර්ෂයේදී ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නව කොන්ත්‍රාත්තුවක් ලෙස ආරම්භ කර තිබූ අතර 2022 පෙබරවාරි මස අවසන් කිරීමට නියමිතව තිබුණි. විවිධ හේතූන් මත ඉදිකිරීම් කාලය 2022 ජූලි 15 දින දක්වා කාලය දීර්ඝ කිරීම් සිදුකර තිබුණ ද 2021 වර්ෂයේ සිට නැවතත් මෙහි ඉදිකිරීම් නවතා දමා තිබීම හේතුවෙන් මෙම වාර්තාව නිකුත් කරන දින දක්වාම ගොඩනැගිල්ල වැසිවලට පාත්‍රවෙමින් ගොඩනැගිල්ලේ අනාගත පැවැත්මට හානිදායක තත්ත්වයකට පත්වෙමින් පැවතුණු | බැංකු ඇපකරයේ වලංගු කාලය 2023 ජූනි මස දක්වා දීර්ඝ කිරීමට ඉල්ලීම් කර ඇති අතර අවසන් බිල්පත තවමත් පරික්ෂා කරමින් පවතින බැවින් රජයට යම් අලාභයක් සිදු වූයේ නම් එය කාර්ය සාධන බැඳුම්කරය මඟින් අයකර ගැනීමට කටයුතු කරන බව හා ගොඩනැඟිලි දෙපාර්තමේන්තුව විසින් ඉතිරි වැඩ සඳහා නව ඇස්තමේන්තුවක් මේ වන විට සකස් කරමින් පවතින බව. | රජයට අයවිය යුතු අත්තිකාරම් මුදල හා වැඩබිම තිබූ ඉදිකිරීම් ද්‍රව්‍ය සඳහා රජයට අය විය යුතු මුදල් කොන්ත්‍රාත්කරුගෙන් අයකරගත යුතු අතර රජයට යම් අලාභයක් සිදු වූයේ නම් කාර්ය සාධන බැඳුම්කරය මඟින් අයකර ගත යුතුය. ඉතිරි වැඩ නව ඇස්තමේන්තුවක් මගින් හෝ කඩිනමින් ඉටුකරවා ගත යුතුය. |

අතර ඉදිකිරීම් කටයුතු ආරම්භ කර වර්ෂ 06 ක් ඉක්මවා තිබුණ ද අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කිරීමට නොහැකි වීම මත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට විවිධ සේවා ලබාගැනීම සඳහා පැමිණෙන මහජනතාව මෙන් ම කාර්ය මණ්ඩලයද දැඩි ලෙස දුෂ්කරතා වලට ලක්වෙමින් පැවතුණි. දෙවන අදියර සඳහා කොන්ත්‍රාත්කරු වෙත රු.39,569,971 ක් ගෙවා තිබූ අතර ගෙවන ලද බිල්පත් සහ මේ වන විට නිම කරන ලද වැඩ වටිනාකම අතර වෙනසක් පැවතිය හැකි බැවින් හා වැඩබිම ඉතිරිවී තිබුණු ඉදිකිරීම් ද්‍රව්‍ය සඳහා ගෙවීම් කර ඇතත් එම ද්‍රව්‍ය කොන්ත්‍රාත්කරු විසින් වැඩ බිමෙන් ඉවත් කර ගෙන ඇති බැවින් ඒ සියල්ල කොන්ත්‍රාත්කරුගෙන් අයකරගත යුතු නමුත් රජයට අයවිය යුතු අත්තිකාරම් මුදල හා වැඩ බිමෙහි ඉතිරිව තිබූ ඉදිකිරීම් ද්‍රව්‍ය සඳහා ගෙවිය යුතු මුදල් ගෙවීමට කොන්ත්‍රාත්කරු 2023 පෙබරවාරි 22 දින පැවති සාකච්ඡාවේදී එකඟ වී තිබුණද අවසන් බිල්පත 2023 අප්‍රේල් 26 විගණිත දින දක්වාත් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් රජයට අය විය යුතු මුදල ගණනය කිරීම සිදුකර නොතිබිණි. කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද වටිනාකම රු.19,739,864 ක් වූ බැංකු ඇපකරයන්හි වලංගු කාලය 2022 දෙසැම්බර් 31 දින ඉක්ම යාමට පෙර වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කටයුතු කර නොතිබුණි.

## 3.3 දේශීය අරමුදල් යෙදවූ ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම ඉතිරි වැඩ කර්මාන්තය රු.51,000,000 ක මුළු පිරිවැය ඇස්තමේන්තුවක් යටතේ ඉටුකර තිබුණු අතර එහිදී අතිරේක වැඩ වෙනුවෙන් කොන්ත්‍රාත්කරු ඉල්ලුම්කල මිලට වඩා වැඩිපුර ගෙවීම, අදාල ගොඩනැගිලි ගාස්තු උපලේඛණයේ සඳහන් මිලට වඩා වැඩිපුර ගෙවීම හා භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණයවූ ප්‍රමාණවලට වඩා වැඩියෙන් ගෙවා තිබීම ආදී කරුණු හේතුවෙන් රු.921,457 ක් වැඩියෙන් ගෙවා තිබුණි.<br><br>කර්මාන්තයේ වැඩ නිම කිරීමට අදාළව වැඩ අවසන් කළ බවට වාර්තාවක්, වෙනස් කිරීමට අදාළව කොන්ත්‍රාත්කරු විසින් ලබාදෙන සැලසුම්, වැඩ නිම කළ පසු ලබාදෙන සැලසුම්, විදුලි උපාංග සම්බන්ධව වරලත් විදුලි ඉංජිනේරු වාර්තාවක් වොරන්ටි සහ ගැරන්ටි සහතික සහ කොන්ත්‍රාත්කරු ගේ වගකීම් සහතිකය යන කිසිවක් විගණනයට ලබා දී නොතිබුණි.<br>එසේ ම ඉදිකිරීමේ දී ඇස්තමේන්තුවේ සඳහන් වැඩ විෂයන් 65 ක් අත්හැර තිබූ අතර, එම අත්හළ වැඩවල මුළු වටිනාකම රු.10,893,740 ක් විය. මෙම අත්හළ වැඩ, වෙනස් කිරීම් සහ අතිරේක වැඩ සඳහා 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 පරිදි වාර්තා පිළියෙල කර අනුමැතීන් ලබාගෙන නොතිබුණු අතර දිනකට ප්‍රමාද ගාස්තු රු.6,278 ක් අඩුවෙන් දක්වා ගිවිසුම් ප්‍රකාරව අයකලයුතු රු.3,295,654 ක ප්‍රමාද දඩ මුදල් අයකර නොතිබුණි. මාසික ප්‍රගති වාර්තා නොමැති වීම හා වැඩ සැලැස්මක් නොමැති වීම හේතුවෙන් ප්‍රමාදය නිවැරදි හා සාධාරණ ද යන්න නිශ්චය කල නොහැකිවීම නිසා මිල විචලනය සඳහා ගෙවා තිබූ රු.1,027,556 ක මුදල නිවැරදිද යන්න විගණනයට තහවුරු නොවීය. | වැඩ නිම කළ පසු ලබා දෙන සැලසුම් ඉදිරිපත් කරන ලෙසට කොන්ත්‍රාත්කරු දැනුවත් කර ඇති අතර, රටේ පැවති කොවිඩ් වසංගත තත්ත්වය නිසා ඇතිවූ ඉදිකිරීම් අමුද්‍රව්‍ය හා සේවක හිඟය මෙන්ම ඉදිකිරීම් අමුද්‍රව්‍ය මිල සීඝ්‍රයෙන් ඉහල යාම ආදිය නිසා අවස්ථා කිහිපයකදීම මෙම ඉදිකිරීම් අයිතමයන් සඳහා සාධාරණ මිල වැඩිවීමක් සඳහා කොන්ත්‍රාත්කරු ඉල්ලීම් කලද එය ලබා නොදෙන ලද බව, ඒ අනුව ප්‍රමාද ගාස්තු අය කිරීම සිදු නොකරන ලද බව හා මිනුම් ගැනීමේදී සිදුවූ ප්‍රමාදයකින් ඉදිකරන ලද වේදිකාවේ වර්ග අඩි 46.23 සඳහා රු.85,525.50 ක් වැඩිපුර ගෙවීම් කර ඇති අතර එය කොන්ත්‍රාත්කරුගේ අතරුදවුම් මුදලින් අඩුකර ගැනීමට කටයුතු කරන බව. | මෙම කොන්ත්‍රාත්තුව ඉටුකිරීම සම්බන්ධයෙන් ස්වාධීන පරීක්ෂණයක් පවත්වා වැඩිපුර ගෙවීම් කොන්ත්‍රාත්කරුගෙන් අයකරගතයුතු අතර අත්හළ වැඩ, වෙනස් කිරීම් සහ අතිරේක වැඩ සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ පරිදි වාර්තා පිළියෙල කර අනුමැතීන් ලබාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මදුරාවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම - ඉතිරි වැඩ කර්මාන්තය රු.53,000,000 ක මුළු පිරිවැය ඇස්තමේන්තුවක් යටතේ ඉටුකර තිබුණු අතර එහිදී සියලුම අත්හළ වැඩ, වෙනස් කිරීම් සහ අතිරේක වැඩ වෙනුවෙන් අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ ලිඛිත ඉල්ලීම්, වගකිව යුතු නිලධාරින්ගේ නිර්දේශ නොතිබුණි.<br>කර්මාන්තය නිම කිරීමට අදාළව වැඩ අවසන් කළ බවට වාර්තාවක්, වෙනස් කිරීමට අදාළව කොන්ත්‍රාත්කරු විසින් ලබාදෙන සැලසුම්, වැඩ නිම කළ පසු ලබාදෙන සැලසුම්, විදුලි උපාංග සම්බන්ධව වරලත් විදුලි ඉංජිනේරු වාර්තාවක්, වොරන්ටි සහ ගැරන්ටි සහතික සහ කොන්ත්‍රාත්කරුගේ වගකීම් සහතිකය යන කිසිවක් විගණනයට ලබා දී නොතිබුණි.<br>එසේම ඉදිකිරීමේදී ඉංජිනේරු ඇස්තමේන්තුවට අදාලව වැඩ විෂයන් 54 ක් අත්හැර තිබූ අතර, එම අත්හළ වැඩ වල මුළු වටිනාකම රු.5,673,089 ක් විය. එසේම දිනක ප්‍රමාද ගාස්තුව රු.7,650 ක් අඩුවෙන් දක්වා ගිවිසුම් ප්‍රකාරව අයකලයුතු , රු.3,650,016 ක ප්‍රමාද දඩ මුදල් අයකර නොතිබුණු අතර. ප්‍රසම්පාදන කමිටුව මගින් 2021 දෙසැම්බර් 31 දක්වා කාලය දීර්ඝ කිරීම් කර තිබුණද කාලය දීර්ඝ කිරීම් සිදුකරන විට වැඩ සැලැස්මක් ඉදිරිපත් කර නොතිබීම මත මෙන්ම දිස්ත්‍රික් ඉංජිනේරු අංශය විසින් කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් කිසිදු අවස්ථාවක ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබීම නිසාද එකී කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම් විගණනයේදී පිළිගත නොහැකිවිය. | මෙම වැඩ විෂයන් 54 තුල "Provisional Sum" ලෙසින් සඳහන් කර වැඩ අයිතම කිහිපයක් ඇති බව හා ඒවා කාර්යය නිම කිරීමෙන් මිනුම් ලබා ගෙන ගෙවීම් පසුව කිරීමට ඇති අයිතමයන් වන බව. දිනක ප්‍රමාද ගාස්තුව කොන්ත්‍රාත් වටිනාකමින් .05% වියයුතු අතර ප්‍රමාද දෝෂයකින් එම ප්‍රතිශතය .025% ලෙසින් සටහන්ව ඇති බව. මේ කාලයේ රටේ පැවති කොවිඩ් වසංගත තත්වය හමුවේ ටෙන්ඩරය විවෘත කල දින සිට ආරම්භ කිරීමට ලබා දුන් දිනය දක්වාම පැවතියේ අයහපත් කාලයක් නිසා යම් යම් ප්‍රමාදවීම් සිදු වූ බව. | මෙම කොන්ත්‍රාත්තුව ඉටුකිරීම සම්බන්ධයෙන් ස්වාධීන පරීක්ෂණයක් පවත්වා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පාලින්දනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තීනියාවල ග්‍රාම නිලධාරී වසමේ සිදුකර තිබූ කිතුල් සංවර්ධන මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණය සඳහා ඉංජිනේරු ඇස්තමේන්තුව සකස් කිරීමේදී කුමන ගොඩනැගිලි ගාස්තු උපලේඛනයක් පදනම් කරගත්තේ ද යන්න සඳහන් කර නොතිබූ අතර ඒ ඒ අයිතම සඳහා අදාල කරගත් ප්‍රමාණයන් තහවුරු කරගැනීමට ස්ථානයේදී ලබාගත් ප්‍රමාණ ඇතුලත් කර මිනුම් පත්‍රයක් හෝ සටහන් පත්‍රයක් පිළියෙල කර නොතිබුණි.<br>ගොඩනැගිල්ල නවීකරණයේදී සිදුකළ අතිරේක වැඩ වෙනුවෙන් ගෙවීම් කිරීම සඳහා අදාළ පාර්ශවයන්ගේ ලිඛිත ඉල්ලීම් හා ඒ සඳහා වගකිව යුතු පාර්ශවයන්ගේ නිර්දේශ ලබාගෙන නොතිබුණි.<br>ගිවිසුම්ගත කාල සීමාව තුළ කර්මාන්තය නිම කිරීමට කොන්ත්‍රාත්කරු ගෙන් වැඩ සැලැස්මක් ලබාගෙන නොතිබූ අතර කාර්යයට අදාල වැඩ සැලැස්මක් ද ලබාදී නොතිබුණි.<br>කර්මාන්තයේ වැඩ අවසන් කළ බවට වාර්තාවක්, වෙනස් කිරීම්වලට අදාළව කොන්ත්‍රාත්කරු විසින් ලබාදෙන සැලසුම්, වැඩ නිම කළ පසු ලබාදෙන සැලසුම්, විදුලි උපාංග සම්බන්ධව වරලත් විදුලි ඉංජිනේරු වාර්තාවක්, වොරන්ටි සහ ගැරන්ටි සහතික සහ කොන්ත්‍රාත්කරුගේ වගකීම් සහතික ලබගෙන නොතිබුණි.<br>ගොඩනැගිල්ලේ සවිකර තිබුණු සිවිලිං විදුලි පංකා 02 ක් ක්‍රියාත්මක කළහැකි පරිදි සවිකර නොතිබුණ ද ඒ සඳහා රු.34,240 ක් ගෙවා තිබුණු අතර සවිකර තිබුණු දොරවල් 05 අගුළු දමා වැසිය නොහැකි වුවද ඒ සඳහා රු.49,683 ක් ගෙවීම් කර තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | මෙම කොන්ත්‍රාත්තුව ඉටුකිරීම සම්බන්ධයෙන් ස්වාධීන පරීක්ෂණයක් පවත්වා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන - 2021 යටතේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල 07 ක ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘති සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) | පාලින්දනුවර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ කිතුල් නිෂ්පාදන අලෙවි මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා රු.2,932,679 ක් ද ප්‍රතිලාභීන් වෙත කිතුල් නිෂ්පාදන ආශ්‍රිත උපකරණ ලබාදීම සඳහා රු.2,148,000 ක්ද වශයෙන් රු.5,080,679 ක් | පිළිතුරු ඉදිරිපත්කර නොතිබුණි. | ව්‍යාපෘතිය අපේක්ෂිත අරමුණ කරා ළඟා වී නොතිබීම සම්බන්ධයෙන් පසුවිපරම් කලයුතු අතර වගකිවයුත්තන්ට |

| | | |
|---|---|---|
| වැයකර ක්‍රියාත්මක කර තිබුණු කිතුල් නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සිදුකළ භෞතික පරීක්ෂාවේදී ඉදිකර වසරක් ඉක්ම යාමට පෙර අලෙවි මධ්‍යස්ථානයේ ගොඩනැගිල්ලේ පිටුපස හා හා පැති බිත්තිවල සැලකිය යුතු මට්ටමේ ඉරිතැලීම් සහ පිපිරීම් දක්නට ලැබුණු අතර අවසන් බිල්පත මගින් කොන්ක්‍රීට් පුටු හා මේස කට්ටල 02 ක් සඳහා රු.49,500 ක් ගෙවා තිබුණද භෞතික පරීක්ෂාවේදී එක් කොන්ක්‍රීට් පුටු හා මේස කට්ටලයක් පමණක් දක්නට ලැබුණු බැවින් රු.24,750 ක් වටිනා කොන්ක්‍රීට් පුටු හා මේස කට්ටලයක ඌනතාවයක් විය. | | එරෙහිව කටයුතු කළ යුතුය. |
| මෙම ව්‍යාපෘතිය යටතේ කිතුල් නිෂ්පාදන කර්මාන්තයේ යෙදෙන තෝරාගත් ප්‍රතිලාභීන් 05 දෙනෙකුට කිතුල් නිෂ්පාදනාගාර ඉදිකිරීමට අමුද්‍රව්‍ය ලබාගැනීම සඳහා එක් අයෙකුට රු.100,000 බැගින් ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉතිරිය ප්‍රතිලාභියාගේ දායකත්වයෙන් නිෂ්පාදනාගාරය ඉදිකළ යුතු විය. නියැදි භෞතික පරීක්ෂාවේදී, ප්‍රතිලාභීන් වෙත සිමෙන්ති කොට්ට, බ්ලොක් ගල්, ඇස්බැස්ටස් තහඩු, ටයිල් කැට සහ මිලි මීටර 10 කම්බි ලබාදුන් බවට බඩු වට්ටෝරු ලේඛනයේ ඇතුළත් කර ප්‍රතිලාභියා ද ඒවා ලබාගත් බවට අත්සන් යොදා තිබුණ ද, අදාල භාණ්ඩ ලබාදී තිබුණු ගෙඩනැගිලි ද්‍රව්‍ය වෙළඳ සැලෙන් ලබාගත් බවට අත්සන් යොදා තිබුණු සියලුම ද්‍රව්‍ය ප්‍රතිලාභීන්වෙත නොලැබී තිබුණු අතර ඇතැම් ද්‍රව්‍ය වෙනුවට ඒවායේ වටිනාකම් සඳහා වෙළඳසැලෙන් මුදල්ද ලබාදී තිබුණි. | පිළිතුරු ඉදිරිපත්කර නොතිබුණි. | ව්‍යාපෘතිය අපේක්ෂිත අරමුණ කරා ළඟා වී නොතිබීම සම්බන්ධයෙන් පසුවිපරම් කලයුතු අතර වගකිවයුත්තන්ට එරෙහිව කටයුතු කළ යුතුය. |
| කෙසේ වුවද භෞතික පරීක්ෂාවේදී ප්‍රතිලාභීන් 03 දෙනෙකු විසින්ම නිෂ්පාදනාගාර ගොඩනැගිල්ල ලින්ටල් මට්ටම ආසන්නයට බිත්ති පමණක් බැඳ අත්හැර දමා තිබුණු බැවින් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණ ඉටුවී නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත්කර නොතිබුණි. | ව්‍යාපෘතිය අපේක්ෂිත අරමුණ කරා ළඟා වී නොතිබීම සම්බන්ධයෙන් පසුවිපරම් කලයුතු අතර වගකිවයුත්තන්ට එරෙහිව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | සෞභාග්‍යා ව්‍යාපෘතිය යටතේ බේරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිය යටතේ සිය ගොවිබිම් ආරක්ෂා කර ගැනීමට එක් ප්‍රතිලාභියෙකුට මීටර 03 ක් උස මීටර 50 ක් දිග කෘෂි ආරක්ෂණ දැල් රෝල් 03 බැගින් ප්‍රතිලාභීන් 45 දෙනෙකුට ලබා දී තිබුණ ද 2023 ජනවාරි 23 දින විගණනයට ඉදිරිපත් කර තිබූ තොරතුරුවලට අනුව ගොවීන් 05 දෙනෙකු විසින් පමණක් එම දැල් භාවිතා කර ගොවිබිම ආරක්ෂා කර තිබුණු අතර ඉතිරි ගොවීන් 40 දෙනාම තමන් විසින් ලබාගත් කෘෂි ආරක්ෂණ දැල් යොදාගෙන ගොවිබිම් සකස් කර නොතිබුණි. ඒ අනුව රුපියල් 3,060,000 ක් වටිනා දැල් අවශ්‍ය කාල සීමාව තුල කිසිඳු ඵලදායී කටයුත්තකට යොදා නොතිබීම හේතුවෙන් ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵල ඉටු වී නොතිබුණි. | සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ කෘෂි ආරක්ෂණ දැල් ප්‍රතිලාභීන් 45 දෙනෙක් යටතේ සාර්ථකව බෙදා අවසන් කර ඇති අතර භාවිත නොකළ ආරක්ෂිත දැල් 09 පිළිබඳ පරික්ෂා කර බලා ගත හැකි ක්‍රියා මාර්ග පිළිබඳ අදාල නිලධාරීන් දැනුවත් කර ඇති බව. | කෘෂි ආරක්ෂණ දැල් අදාල කාර්යයට නොයෙදවීම සම්බන්ධයෙන් පසුවිපරම් කලයුතු අතර ඒවා ඌන උපයෝජනය සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව කටයුතු කළ යුතුය |
| (iii) | පානදුර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ ඉහළ ගුණත්වයෙන් යුතු ජාඩි නිෂ්පාදනය ව්‍යාපෘතිය තෝරාගෙන තිබුණු අතර වැඩසටහන ක්‍රියාත්මක කළ වසම් 03 ට අදාළව එම වසම් භාර සංවර්ධන නිලධාරීන්ගේ වාර්තාවලට අනුව වර්තමානයේ ඉතාමත් සුළු වශයෙන් පමණක් ජාඩි නිෂ්පාදනය සිදුකරනු ලබයි. වර්තමානයේ ජාඩි ප්‍රතිලාභීන් මුහුණ දී ඇති විවිධ ගැටළු හේතුවෙන් මෙම ව්‍යාපෘතිය අපේක්ෂිත අරමුණ කරා ළඟා වී නොතිබුණි. ජාඩි නිෂ්පාදන බැරල් මිලදී ගැනිම සඳහාවූ ප්‍රසම්පාදන කමිටු වාර්තාව අනුව ලී පීප්ප මිලදී ගැනිමට තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කළද එම නිර්දේශය නොසලකා හරිමින් හා ප්ලාස්ටික් බදුන්වල ජාඩි නිෂ්පාදනය සෞඛ්‍යාරක්ෂිත නොවන බව අදාල අංශ පෙන්වා දී තිබියදිත් මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රතිලාභීන්ගේ ඉල්ලීම මත පමණක් ආහාර ශ්‍රේණියේ ප්ලාස්ටික් බඳුන් ලබාදීම මගින් “ඉහළ ගුණත්වයෙන් යුතු ජාඩි නිෂ්පාදනය” සඳහා වූ ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණ ඉටු වී නොතිබුණු අතර ප්‍රතිලාභීන් 36 දෙනෙකු අතර බෙදා දී තිබූ ප්ලාස්ටික් බඳුන් 108 ක් මිලදී ගැනීම සඳහා වැය කරන ලද රු.442,800 ක මුදල නිශ්කාර්ය වියදමක් වී තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ව්‍යාපෘතිය අපේක්ෂිත අරමුණ කරා ළඟා වී නොතිබීම සම්බන්ධයෙන් පසුවිපරම් කලයුතු අතර වගකිවයුත්තන්ට එරෙහිව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iv) | වලල්ලාවිට ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති අතර එක් ව්‍යාපෘතියක් වූ බුලත් වගා ව්‍යාපෘතිය සඳහා දරා තිබූ මුළු පිරිවැය රු.7,196,341 ක් වූ අතර එයින් බුලත් වගාව සඳහා ප්‍රතිලාභී ගොවීන්ට කෘමි ප්‍රතිරෝධක දැල් ලබාදීම සඳහා පමණක් රු.3,643,669 ක මුදලක් ගෙවා තිබුණද ගොවීන් වෙත කෘමි ප්‍රතිරෝධක දැල් වෙනුවට බුලත් වගාවේ කෘමි ප්‍රතිරෝධයට කිසිදු අදාලත්වයක් නොමැති මායිම් වෙන්කිරීම සඳහා නිවාස හා පාසල් වල භාවිතා කරන දැල් මේ සඳහා සපයා තිබුණි. 2023 වර්ෂයට අදාලව විගණිත දිනය වන විට ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ලබාගත් ප්‍රගති වාර්තාවට අනුව ප්‍රතිලාභීන් 45 දෙනෙකු බුලත් වගාවේ සාර්ථක ප්‍රතිඵල ලබාගෙන නොතිබුණු අතර ඒ අනුව එක් ප්‍රතිලාභියෙකු වෙනුවෙන් රු.80,858 බැගින් වැයකර තිබුණු ව්‍යාපෘතියේ සමස්ථ නිශ්කාර්ය වැය රු.3,638,610 ක් විය. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ව්‍යාපෘතිය අපේක්ෂිත අරමුණු කරා ළඟා වී නොතිබීම සම්බන්ධයෙන් පසුවිපරම් කලයුතු අතර වගකිවයුත්තන්ට එරෙහිව කටයුතු කළ යුතුය. |
| (v) | සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ වලල්ලාවිට ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මකර කර තිබූ අනෙක් ව්‍යාපෘතිය වූ මණ්ඩගල කුරුඳු ගම්මානය සඳහා කුරුඳු නිස්සාරණ මධ්‍යස්ථානයක් ඉදිකිරීමට රු.3,424,311 ක මුදලක් වැයකර තිබුණු අතර ව්‍යාපෘති යෝජනාවට අනුව මෙම කුරුඳු නිස්සාරණ මධ්‍යස්ථානයෙන් මාසිකව කුරුඳු කොළ භාවිතයෙන් තෙල් බෝතල් 15 ක් හා කුරුඳු පොතු භාවිතයෙන් මාසිකව තෙල් බෝතල් 12 ක් ද වශයෙන් නිපදවීමට අපේක්ෂා කර තිබුණද මධ්‍යස්ථානය ආරම්භ කර විගණිත අවස්ථාව වන විට වසරකට අධික කාලයක් ගත වී තිබුණ ද එහි ප්‍රගතිය කොල භාවිතයෙන් තෙල් බෝතල් 04 ක්ද, පොතු භාවිතයෙන් තෙල් බෝතල් භාගයක්ද පමණක් වශයෙන් වූ බව අනාවරණය විය. මේ අනුව මධ්‍යස්ථානයේ අපේක්ෂිත ප්‍රගතිය සියයට 01 කටත් වඩා අඩු බව නිරීක්ෂණය වූ අතර මධ්‍යස්ථානයේ ඉදිරි අපේක්ෂිත ප්‍රගතිය සාර්ථක කරගැනීම සඳහා කිසිදු ප්‍රමාණවත් පිලිගත හැකි වැඩපිළිවෙලක් හඳුන්වා දී නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ව්‍යාපෘතිය අපේක්ෂිත අරමුණු කරා ළඟා වී නොතිබීම සම්බන්ධයෙන් පසුවිපරම් කලයුතු අතර වගකිවයුත්තන්ට එරෙහිව කටයුතු කළ යුතුය. |
| (vi) | අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කර තිබූ එක් ව්‍යාපෘතියක්වූ හඳුන්කූරු නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා රු.1,367,250 ක් වැයකර තිබූ අතර ව්‍යාපෘතියෙන් අපේක්ෂිත | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ව්‍යාපෘතිය අපේක්ෂිත අරමුණු කරා ළඟා වී නොතිබීම සම්බන්ධයෙන් පසුවිපරම් කලයුතු අතර |

| | | | |
|---|---|---|---|
| | ප්‍රගතිය ලෙස දිනකට එක් ප්‍රතිලාභියෙකු විසින් බෙහෙත් කිලෝ 8 ක හඳුන්කූරු නිෂ්පාදනය ඉලක්ක කර තිබුණි. ඒ අනුව මාසිකව එක් ප්‍රතිලාභියෙකු හඳුන්කූරු 224,000 ක් නිෂ්පාදනය කළ යුතු වුවද 2022 සැප්තැම්බර් 30 දිනට ඉදිරිපත් කර තිබූ ප්‍රගති වාර්තා අනුව වසරකට ආසන්න කාලයක් ගතවී තිබුණ ද එකී නිෂ්පාදන ඉලක්කය ළඟා කර ගැනිමට කිසිවකු සමත් වී නොතිබුණි. 2023 පෙබරවාරි 09 දින විගණනය විසින් සිදු කරන ලද භෞතික පරීක්ෂාවට අනුව සහ ඉදිරිපත් වූ ප්‍රගති වාර්තාවලට අනුව ප්‍රතිලාභීන් 30 දෙනාගෙන් 16 දෙනෙකුම එනම්, සියයට 53 ක් හඳුන්කූරු නිෂ්පාදන කටයුතු නතර කර තිබුණි. අමුද්‍රව්‍ය සපයාගැනීමේ අපහසුව, රෝගාබාධ, වෙළඳ පොළ සොයාගැනීමේ දුෂ්කරතාවය හා නිසි සම්බන්ධීකරණයක්, මෙහෙයවීමක් හා පාලනයක් නොමැති වීම ඇතුළු හේතූන් මත ප්‍රතිලාභීන්ගෙන් සියයට 50 කටත් වඩා වැඩියෙන් නිෂ්පාදන නවතා තිබීම මත අදාල ව්‍යාපෘතිය මේ වන විට අසාර්ථක තත්ත්වයට පත්ව තිබුණු අතර දැනට ක්‍රියාකාරී මට්ටමේ පවතින ප්‍රතිලාභීන්ගේද ප්‍රගතිය අපේක්ෂිත පරිදි සතුටුදායක මට්ටමක නොපැවතුණි. | | වගකිවයුත්තන්ට එරෙහිව කටයුතු කළ යුතුය. |
| (vii) | අගලවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කර තිබූ අනෙක් ව්‍යාපෘතිය වූ අපනයනය සඳහා එළවළු වගා ව්‍යාපෘතිය සඳහා රු.4,094,875 ක වියදම් ඇස්තමේන්තුවක් සකසා තිබූ නමුත් ව්‍යාපෘතිය වෙනුවෙන් දරා තිබුණු වියදම රු.1,655,100 ක් පමණක් විය. ඒ ප්‍රතිලාභීන් 20 දෙනෙකු සඳහා එක් ප්‍රතිලාභීයෙකු වෙත පිරිවැය රු.64,800 ක් වූ කෘමි ප්‍රතිරෝධක දැල් රෝල් 03 බැගින් හා පිරිවැය රු.17,955 ක් වූ එළවළු ඇසුරුම් කූඩ 02 බැගින් ලබා දීම සඳහා විය.<br><br>විගණන නියැදි පරීක්ෂාවට ලක් වූ ප්‍රතිලාභීන් 04 දෙනෙකුම තමන් ලබාගෙන තිබූ දැල් නිසියාකාරව අදාල අරමුණ ඉටුවන පරිදි භාවිතා කර නොතිබුණු අතර ලබා දී තිබුණු ඇසුරුම් කූඩ ද භාවිතා නොකර නිවසේ සුරක්ෂිතව තබා තිබුණි. ව්‍යාපෘති වාර්තාවට අනුව රු.44,000,000 ක වාර්ෂික ආදායමක් අපේක්ෂා කර තිබුණද ප්‍රතිලාභීන් 20 දෙනෙකු සඳහා එක් කන්නයකදී අලෙවියෙන් ලද ආදායම රු.473,000 ක් පමණක් වූ අතර ව්‍යාපෘතියෙන් | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ව්‍යාපෘතිය අපේක්ෂිත අරමුණ කරා ළඟා වී නොතිබිම සම්බන්ධයෙන් පසුවිපරම් කලයුතු අතර වගකිවයුත්තන්ට එරෙහිව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අපේක්ෂිත නිෂ්පාදනය අක්කර 20 ක භූමි ප්‍රමාණයක අපනයනය සඳහා මෑ කරල් හා පිපිඤ්ඤා නිෂ්පාදනය වුවද අදාල වගා බිම්වල සිදුකල භෞතික පරීක්ෂාවේදී හා ව්‍යාපෘති ප්‍රගති වාර්තාව ප්‍රකාරව පිපිඤ්ඤා වගාකර තිබුණේ එක් ප්‍රතිලාභියෙක් පමණක් වූ නමුත් අපේක්ෂිත වාර්ෂික ඵලදාව පිපිඤ්ඤා කිලෝ ග්‍රෑම් 600,000 ක් විය.<br>එමෙන්ම ව්‍යාපෘති වාර්තාවෙන් අපේක්ෂිත පරිදි මෙසේ වගා කරන ඵලවළු අපනයනය පිණිස සැකසීම සඳහා වසම් 04 වෙනුවෙන් මධ්‍යස්ථාන 02 ක් ඉදිකිරීමට ද, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂි ව්‍යාපාර අංශය මගින් හඳුන්වා දුන් අලෙවි මධ්‍යස්ථාන දෙකක් පිහිටුවීමට ද සැලසුම් කර තිබූ නමුත් එකී කිසිදු සැලැස්මක් ක්‍රියාත්මක කර නොතිබුණි.<br><br>එමෙන්ම වගාවේ ස්ථිරසාර නිෂ්පාදනයක් ඇතිකර ගැනීම සඳහා දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ, නියෝජ්‍ය පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ හා ගොවිජන සේවා සහකාර කොමසාරිස්ගේ සහය ලබාගැනීමට අපේක්ෂා කර තිබුණු අතර ජාත්‍යන්තර වෙළඳපොල සකස් කිරීම සඳහා පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂි ව්‍යාපාර සංවර්ධන තොරතුරු සේවයේ සහාය ලබාගැනීමට අපේක්ෂා කර තිබුණි. එසේ වුවද ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ඉහත අපේකෂිත කිසිදු විශේෂඥ සහායක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ව්‍යාපෘතියෙන් අපේක්ෂා කර තිබූ කිසිදු ඉලක්කයක් කරා ළඟා වී නොතිබුණි. | | |
| (viii) | ඉංගිරිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපාරික විසිතුරු මත්ස්‍ය වගා ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා ප්‍රතිලාභින් 61 දෙනෙකු සඳහා රු.6,100,000 ක මුදල් ප්‍රතිලාභ ලබා දී තිබුණු අතර ව්‍යාපෘති වාර්තාවට අනුව පළමු අදියර යටතේ මාළු ටැංකි සාදාගැනීමට අදාල භූමිය සකස් කළ පසු දිරි ගැන්වීම් මුදලින් සියයට 50 ක් ගෙවීම හා දෙවන අදියර යටතේ ටැංකි සකස් කර අවසන් වීමෙන් පසු මසුන් තැන්පත් කිරීමේදී ඉතිරි රු.50,000 බැගින් මුදල් නිදහස් කරන බව දක්වා තිබුණද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සැලසුම් අංශය මගින් සකස් කරන ලද භෞතික ප්‍රගතිය පිළිබඳ වාර්තාවට අනුව ප්‍රතිලාභීන් 27 දෙනෙකු ම මාළු ටැංකි සකස් කර තිබුණද මසුන් ටැංකිවලට දමා ව්‍යාපෘතිය ආරම්භ | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි | ව්‍යාපෘතිය අපේක්ෂිත අරමුණ කරා ළඟා වී නොතිබීම සම්බන්ධයෙන් පසුවිපරම් කලයුතු අතර වගකිවයුත්තන්ට එරෙහිව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කරන මට්ටමට එම ටැංකි පත් කර නොතිබුණු අතරම මසුන්ද තැන්පත් කර නොතිබුණි.<br><br>එසේ වුවද එම ප්‍රතිලාභීන් සඳහා නියමිත අවශ්‍යතාවයන් සපුරාලීමෙන් තොරව රු.50,000 බැගින් රු.1,350,000 ක් ගෙවා තිබුණු අතර ව්‍යාපෘතියේ සඳහන් අදාල අවම අවශ්‍යතාවයන්වත් සපුරාලීමෙන් තොරව ප්‍රතිලාභීන් 02 දෙනෙකුට එක් අයෙකුට රු.100,000 ක් බැගින් රු.200,000 ක් ගෙවා තිබුණි. විගණනය විසින් අදාල ග්‍රාම නිලධාරි වසම්වල සිදුකළ නියැදි භෞතික පරීක්ෂාවේදී සම්පූර්ණ ප්‍රතිලාභ මුදල් ලබාගත් ප්‍රතිලාභීන් 17 දෙනෙකුම අදාල ව්‍යාපෘතිය සම්පූර්ණ නොකර මාලුටැංකි ඉදිකිරීම් විවිධ මට්ටම් යටතේ අත්හැරදමා තිබුණු අතර අදාල වගකිවයුතු නිලධාරින් මේ පිළිබඳව සිය අවධානය යොමුකර නොතිබුණි. ඒ හේතුවෙන් ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵල නොලැබී යාම තුලින් ව්‍යාපෘතිය තුලින් අරමුණු කල ඉලක්ක ලඟාකර ගත නොහැකි වී තිබුණි. | | |
| (ix) | කළුතර දිස්ත්‍රික් ලේකම්ගේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන- තිරසර භාවය පවත්වා ගැනීම සඳහා වන උපදෙස් මාලාවෙහි කරුණු අංක 01 (ii) ට අනුව ප්‍රතිලාභීන්ගේ පෞද්ගලික පරිහරණයට ලබාදී ඇති උපකරණ අදාල නිෂ්පාදන කර්මාන්තය වෙනුවෙන්ම යොදවන්නේද සහ ඒ තුළින් ප්‍රතිලාභීන්ගේ ජීවනෝපාය මාර්ගය වැඩිදියුණු කරන්නේද යන්න වසමේ සංවර්ධන නිලධාරීන්ගේ නිරන්තර අධීක්ෂණයට ලක් කළ යුතු බව දක්වා තිබුණ ද එවැනි නිරන්තර අධීක්ෂණයක් සිදුවන බවට ලිඛිත සාක්ෂියක් විගණනයේදි නිරීක්ෂණය නොවීය. 2021/01 සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන වැඩසටහනේ මාර්ගෝපදේශ සංග්‍රහයේ කරුණු අංක 08 ප්‍රකාරවද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම යටතේ දක්වා ඇති පරිදි ව්‍යාපෘති තිරසාරව පවත්වාගෙන යාමේ වගකීම වසම භාර ආර්ථික සංවර්ධන නිලධාරි වෙත පැවරී තිබෙන බව සඳහන් කර තිබුණද අදාල වගකිවයුතු නිලධාරින් මේ පිළිබඳව සිය අවධානය යොමුකර නොතිබුණි. ඒ හේතුවෙන් සෞභාග්‍යා ව්‍යාපෘතිවල අපේක්ෂිත ප්‍රතිඵල නොලැබී යාම තුලින් ඒවායින් අරමුණු කල ඉලක්ක ලඟාකර ගත නොහැකි වී තිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ව්‍යාපෘති වල සාර්ථකත්වය සඳහා වගකිවයුතු නිලධාරින් නිරන්තර අධීක්ෂණය හා පසුවිපරම සිදු කළ යුතු බව. |

## 3.4 අපේක්ෂිත පරිදි භාවිතයට නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම |
|---|---|---|
| පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය විසින් කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත 2021 වර්ෂයේදී මුදා හැර තිබුණු ප්‍රතිපාදන යටතේ පාලින්දනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තීනියාවල ග්‍රාම නිලධාරී වසමේ සිදුකර තිබූ කිතුල් සංවර්ධන මධ්‍යස්ථාන ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණය සඳහා රු.7,552,300 ක් වැයකර ගොඩනැගිල්ල වටා වැටක් ගසා ප්‍රවේශ මාර්ගය ඉන්ටලොක් ගල් යොදා 2021 වර්ෂය අවසාන වන විට නිමකර තිබුණද විගණිත දිනයවූ 2023 පෙබරවාරි 24 වන දක්වාම ගොඩනැගිල්ල කිසිදු ප්‍රයෝජනයකට නොගෙන පවතින බව නිරීක්ෂණය වූ අතර ගොඩනැගිල්ල පවත්වා ගෙන යාමේ වගකීම හෝ අධීක්ෂණය කිසිදු වගකිවයුතු පාර්ශවයක් වෙත පැවරීමද සිදුකර නොතිබුණි . | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | විගණිත දින වන තෙක් ගොඩනැගිලි හා උපකරණ නිශ්කාර්යව පැවතිම සම්බන්ධයෙන් වගකිවයුත්තන්ට එරෙහිව කටයුතු කළ යුතුය. |

## 3.5 විගණන විමසුම්වලට පිළිතුරු ලබා දීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත නිකුත් කරන ලද විගණන විමසුම් 23 ක් සඳහා 2023 අප්‍රේල් 28 දිනටත් පිළිතුරු එවා නොතිබුණි. | ප්‍රාදේශීය කාර්යාල වලින් හා අදාල අංශයන් වලින් පැහැදිලි කිරීම් ලබා ගැනීමේ ප්‍රමාදයන් පවතින අතර අදාල පැහැදිලි කිරීම් ලද පසු කඩිනමින් ඒ සඳහා පිළිතුරු ලබා දෙන බව. | විගණන විමසුම් සඳහා කාලීනව පිළිතුරු ලබාදී අදාල නිවැරදි කිරීම් කළ යුතු බව. |

## 3.6 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ---------------------- | ----------- |
| (අ) | කළුතර දිස්ත්‍රික්කය තුළ ස්භාවික ආපදා වලින් පූර්ණ හානියට පත් වන සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් අධි අවදානම් නිසා ඉවත් කලයුතු ලෙස බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල හදුනාගත් පවුල් සඳහා "නිවසට නිවසක්" සංකල්පය මත නව නිවසක් සමග ඉඩමක් මිලට ගැනීම යටතේ ප්‍රතිලාභ ලබාදිම සඳහා තෝරාගෙන තිබූ 80 ක කුටුම්භයන්ගෙන් 2023 ජනවාරි 01 දින වන විට පුද්ගලයින් 39 දෙනෙකු වෙනුවෙන් නිවාස සහ ඉඩම් විකුණුම්කරුවන්ට බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් උපරිම රු.1,600,000 ක සීමාව යටතේ රු.54,250,000 ක් ගෙවා තිබුණ ද එසේ මුදල් ගෙවූ තෝරාගත් ප්‍රතිලාභීන් නමට මිලදිගත් ඉඩමේ සහ නිවසේ අයිතිය පවරාගෙන හෝ පවරාගත් බවට තහවුරු කරගෙන නොතිබුණි. තවද ඉහත ව්‍යාපෘතිය යටතේ ඉඩම පමණක් මිලදී ගැනීම සඳහා රු.400,000 බැගින් ප්‍රතිලාභ මුදල් ලබාදුන් ප්‍රතිලාභීන් 05 දෙනෙකු විසින් විගණිත දිනය වූ 2023 මාර්තු 31 දින වන විටත් නිවාස සෑදීම ආරම්භ කර නොතිබුණු අතර රජයේ ඉඩමක නිවාස සෑදීම සඳහා ඉඩම් ලබාදී තිබුණු ප්‍රතිලාභීන් 04 දෙනෙකු විසින් විගණිත දිනය තෙක් නිවාස සෑදීම ආරම්භ කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ප්‍රතිලාභීන් වෙත නිදහස් කල මුදල් අදාල කාර්යය සඳහා යෙදවූ බවට වන තහවුරු කිරීම් නොපමාව ලබා ගතයුතු අතර එලෙස සිදු නොකල ප්‍රතිලාභීන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල හදුනාගත් පවුල් සඳහා "නිවසට නිවසක්" සංකල්ප යටතේ ප්‍රතිලාභීන් වෙත රජයෙන් ලබාදුන් ඉඩමක නිවසක් ඉදිකිරීමට රු.1,200,000 ක් ලබාදීමේ ක්‍රමවේදය ඔස්සේ ප්‍රතිලාභීන් 02 දෙනෙකු විසින් රජයෙන් ලබාදුන් ඉඩම් හා රු.200,000 බැගින් වූ මුල් වාරික ලබාගෙන තිබුණ ද විගණිත දිනය වූ 2023 මාර්තු 20 දින දක්වාම තම නිවාස ඉදිකිරිමේ කටයුතු ආරම්භ කර හෝ නොතිබුණු අතර එම ක්‍රමවේදය යටතේ වාරික මුදල් ලබාගත් ප්‍රතිලාභීන් 03 දෙනෙකු නිවාස ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ වශයෙන් අවසන් කර නොතිබුණි. දෙවන වාරික මුදල් ද නිදහස් කර තිබුණ ද නියමිත මට්ටමට ඉදිකිරීම් කටයුතු සිදුකර නොතිබුණු එක් ප්‍රතිලාභියෙකු හට තෙවන වාරික මුදලින්ද රු.100,000 ක් නිදහස් කර තිබුණ ද ප්‍රතිලාභියා විසින් 2023 මාර්තු 20 දින වන විටත් ඉදිකිරීම් කටයුතු අවසන් කර නොතිබුණි. ප්‍රතිලාභියා මිලදී ගත් ඉඩමට රු.400,000 ක් සහ එම ඉඩමේ නිවසක් ඉදිකිරීම | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ප්‍රතිලාභීන් වෙත නිදහස් කල මුදල් අදාල කාර්යය සඳහා යොදවන බවට තහවුරු කරගැනීම සඳහා ප්‍රමාණවත් පසු විපරම් සිදුකල යුතු අතර පසු විපරම් සිදු නොකර දෙවන වාරික ඉදිකිරීම් සිදු නොකල ප්‍රතිලාභීන්ට 03 වන වාරිකය ගෙවූ නිලධාරීන් සම්බන්ධව ක්‍රියාමාර්ග ගත යුතුය. එම මුදල අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සඳහා රු.1,200,000 ක් ලබාදීම යටතේ තෙවන වාරිකය 2019 දෙසැම්බර් 31 දින ලබාගත් එක් ප්‍රතිලාභියෙකු 2023 මාර්තු 20 දින වන විටත් නිවස ඉදිකිරීම සම්පූර්ණ වශයෙන් අවසන් කර නොතිබුණු අතර මේ සම්බන්ධයෙන් වන අධීක්ෂණය දුර්වල මට්ටමක පැවතුණි. | | |
| (ඇ) | ගිනි අවි බලපත්‍ර අළුත්කිරීමේදී අදාළ පාර්ශව වෙත ගිනි අවි අවශ්‍යතාවය තවදුරටත් පවතින බව නිලධාරීන් විසින් තහවුරු කර ගත් බවට සාක්ෂි ඉදිරිපත් නොවූ අතර නුසුදුසු පුද්ගලයින් අත තුවක්කු ගැවසීම තුලින් වනසතුන්ට හා සිවිල් ජන ජීවිතයට බලවත් තර්ජන එල්ලවිය හැකි බැවින් සහ ගිනි අවි අගති සහගතව පරිහරණය කිරීම වැලැක්වීම සඳහා නියමිත කාලසීමාව තුළ ගිනි අවි බලපත්‍ර අළුත් නොකරන බලපත්‍රලාභීන් සම්බන්ධයෙන් නෛතික ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කිරීම දිස්ත්‍රික් ලේකම් හා කොට්ඨාශ භාර පොලිස් අධිකාරීන්ගේ වගකීම වුව ද එම ආයතන අතර නිසි සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් බලපත්‍ර අළුත් නොකළ ගිනි අවි සඳහා ප්‍රමාණවත් නෛතික ක්‍රියාමාර්ග ගෙන නොමැති බව පානදුර හා හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සිදුකළ නියැදි පරික්ෂාවේ දී නිරීක්ෂණය විය. | පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. | ආයතන අතර නිසි සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් බලපත්‍ර අළුත් නොකළ ගිනි අවි සඳහා ප්‍රමාණවත් නෛතික ක්‍රියාමාර්ග ගැනීම සිදු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක සිදුකල නියැදි විගණන පරීක්ෂාවලදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කම 2022 වර්ෂයේදී තාවකාලික ගොනු 53 ක් මත රු.15,104,023 ක් විශ්‍රාම වැටුප් වශයෙන් ගෙවා තිබුණි. ඒ අනුව අස්ථානගත වූ ගොනු අස්ථානගත වූයේ කවදා ද, කුමන නිලධාරියෙකු භාරයේ තිබියදී ද යනවග හා ඒවා අස්ථානගත වීමට හේතුව අනාවරණය කරගෙන නොතිබුණු අතර පවත්වාගෙන යනු ලබන විශ්‍රාම වැටුප් ගෙවීම් අංශයේ විශ්‍රාම වැටුප් ගොනු , මියයාම් හෝ වෙනත් හේතු මත වෙනස් වන ගොනු, නව එකතු කිරීම් වන ගොනු ආදියට අදාළ තොරතුරු විශ්‍රාම ගොනු සම්බන්ධ ලේඛනයට ඇතුලත් කර එම ගොනු විශ්‍රාම වැටුප් නිලධාරීන්ට භාරදීමක් සහ නිලධාරීන් විශ්‍රාම යාම හෝ ස්ථානමාරු වී යන අවස්ථාවලදි නිලධාරීන් භාරයේ පවතින ගොනු විධිමත් පරිදි භාරදීම හා භාර ගැනීම කිසිඳු අවස්ථාවක සිදුවී නොතිබුණි. එම හේතුවෙන් ගොනු අස්ථානගත වීම්, ප්‍රමාණවත් ලේඛන ගොනුගත නොවීම්, සම්බන්ධ වගකිව යුතු නිලධාරීන් කවුරුන්ද යන්න තහවුරුවට නිසි ක්‍රමවේදයක් ස්ථාපනය වී නොතිබීම නිසා විශ්‍රාම ගොනු හා ලේඛන නඩත්තුව සම්බන්ධයෙන් ප්‍රමාණවත් වෘත්තිය සැලකිල්ලකින් කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය කෙරේ. | අස්ථාන ගත වී ඇති විශ්‍රාම වැටුප් ලිපිගොණු සඳහා තාවකාලික විශ්‍රාම වැටුප් ලිපිගොණු සකස්කර අනුමතිය සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ට යොමු කෙරුණු අතර නිළධාරීන්ගේ ස්ථානමාරු සිදුවන අවස්ථාවේදී විධිමත් පරිදි ඔවුන් භාරයේ පවතින ලිපිගොණු ලේඛණ ගතකොට භාරදීම සඳහා ඉදිරියේදී කටයුතු කරනු ලබන බව. | විශ්‍රාම ගොනු හා ලේඛන නඩත්තුව සම්බන්ධයෙන් ප්‍රමාණවත් වෘත්තිය සැලකිල්ලකින් කටයුතු කල යුතුය. තාවකාලික ගොනු මත ගෙවූ රු.15,104,023 ට අදාල ස්ථිර ලියවිලි නැවත සාදා ගොනුව නැවත සකස් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක විශ්‍රාම ලිපිගොනු 47 ක ගණනය කිරීමේ දෝෂ හා වෙනත් කරුණු මත 2022 දෙසැම්බර් 31 දිනට වැඩිපුර ගෙවා ඇති විශ්‍රාම වැටුප් මුදල රු.5,327,820 ක් වූ අතර එකී මුදල වාරික වශයෙන් අය කර ගනිමින් පැවතුණි. ඒ අතරින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 02 ක විශ්‍රාමිකයන් 05 දෙනෙකු මියයාම හේතුවෙන් රු.330,835 ක් අය නොවී පවතින බව ද නිරීක්ෂණය විය. | මියගිය විශ්‍රාමිකයින්ගෙන් අයකරගත නොහැකිව පවතින විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් සම්බන්ධයෙන් මු.රෙ.104 වාර්තාව සමඟ හානි පාඩු ලේඛණයට වාර්තා කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලබන බව. | වැඩිපුර ගෙවා ඇති විශ්‍රාම වැටුප් මුදල් නොපමාව අයකරගත යුතු අතර වැඩිපුර ගෙවීම් සඳහා වගකිවයුත්තන්ට එරෙහිව කටයුතු කළ යුතුය |
| (ඊ) | භාණ්ඩාගාර ලේකම්ගේ 2021 සැප්තැම්බර් 29 දිනැති අංක PFD/PMD/Cir/2021/01 දරණ මුදල් චක්‍රලේඛයේ 2.1 ඡේදය ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම් විසින් නම් කරනු ලබන නියෝජිතයන් දෙදෙනෙකුගෙන් සමන්විත ත්‍රිපුද්ගල කමිටුවක් මගින් උක්ත චක්‍රලේඛයේ අංක 2.3 යටතේ සඳහන් කර ඇති සුදුසුකම් පරීක්ෂා කර සනාථ කිරීමෙන් අනතුරුව ප්‍රජා පාදක සංවිධාන වෙත ඉදිකිරීම් වැඩ කොන්ත්‍රාත් පැවරිය හැකි අතරම මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2022 නොවැම්බර් 29 දිනැති අංක 06 දරණ චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ලියාපදිංචි කරන ලද ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන/ රාජ්‍ය නොවන සංවිධාන වෙතින් චක්‍රලේඛයේ දක්වා ඇති ලේඛන වාර්ෂිකව ලබාගෙන සංවිධානයේ මුල් ගොනුව යවත්කාලීන කලයුතු වුවද, පානදුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එම තොරතුරු යාවත්කාලීන නොකර, ගිවිසුම්ගත වන අවස්ථාවේදී අදාල සමිතිය සක්‍රීය ද අක්‍රීය ද යන්න තහවුරු කරගැනීමකින් තොරව 2022 වර්ෂයේ කොන්ත්‍රාත් 06 ක් සඳහා ස්වේච්ඡා සමිති 05 ක් සමඟ ගිවිසුම්ගත වී ඉටු කළ වැඩ වෙනුවෙන් රු.3,721,039 ක් ගෙවා තිබුණි. | මෙම ප්‍රජා සමිති ක්‍රියාකාරී ප්‍රජා සංවිධාන බවට අදාල ග්‍රාම නිලධාරී වසමේ සංවර්ධන නිලධාරීන් මඟින් තහවුරු කර ඇති අතර අදාල සමිතියේ නිලධාරි මණ්ඩලය පිළිබඳ සමාජසේවා නිලධාරී විසින් ලිඛිතව වාර්තා කොට ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සමිතිය නමින් පවත්වාගෙන යන බැංකු ගිණුම් ප්‍රකාශයෙහි පිටපතක් ලබාගෙන ඇති බව. | චක්‍රලේඛ ප්‍රකාරව ප්‍රජා පාදක සංවිධාන පිළිබඳ තොරතුරු කාලීනව යවත්කාලීන කළ යුතුය. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2030 තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රයේ අරමුණු 17 ක් යටතේ සංවර්ධන ක්‍රියාකාරකම් හඳුනාගෙන තිබුණද විගණනයට ඉදිරිපත්වූ තොරතුරුවලට අනුව සමාලෝචිත වර්ෂයේ දී දී තිරසාර සංවර්ධන අරමුණු අංක 01 හා අංක 02 සඳහා පිළිවෙලින් එනම් සියළු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම හා යහපත් පෝෂණ තත්ත්වයන් දිනාගෙන තිරසාර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම යටතේ වියළි ආහාර මළු සහ ඉන්දියන් සහනාධාර යටතේ සහල් සහ කිරිපිටි බෙදාහැරීම සිදුකල බව දක්වා තිබුණ ද එම වැඩසටහන කොවිඩ් වසංගතය හා ආර්ථික අර්බුදය හේතුවෙන් ලංකාව පුරා ක්‍රියාත්මක කරන ලද ජාතික වැඩසටහනක් විය. තිරසාර සංවර්ධන සැලසුමෙහි අන්තර්ගත අරමුණු 17 අතරින් අරමුණු අංක 01, 02 හා 06 සඳහා ඉහත සඳහන් කරන ලද ක්‍රියාකාරකම් හැර අනෙකුත් අරමුණු සාක්ෂාත් කර ගැනීමට 2022 වර්ෂයේදී සංවර්ධන ක්‍රියාකාරකම් සිදුකල බවට විගණනයට සාක්ෂි ඉදිරිපත් නොවුණි. | 2022 වර්ෂයේ මුදල් අමාත්‍යංශය මඟින් නිකුත් කරන ලද BD/CBP/01/01/04-2022 අංක දරන 2022 අප්‍රේල් 26 දිනැති චක්‍රලේඛය අනුව සියළුම ව්‍යාපෘති නතර කරන ලෙස දන්වා තිබුණු බැවින් ව්‍යාපෘති බොහොමයක් ක්‍රියාත්මක නොවූ බව හා එබැවින් තිරසාර ඉලක්ක ලඟා කර ගැනීමට නොහැකි වූ බව. | තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රයේ අරමුණු ඉටුකරගැනීම සඳහා කටයුතු කල යුතුය. |

## 5. මහජනතාව වෙත සේවා ඉටු කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මහජනතාව වැඩිපුරම පැමිණෙන ආයතනයන් හි වැඩිම ඉල්ලුමක් ඇති සේවා සඳහා කාර්යසාධක දර්ශක හඳුනාගැනීම හා ඒවා ඉටුකරන ප්‍රමාණය මැනබැලීම සඳහා. ඉලක්කගත සේවාවන් හා ඉලක්කයන් අමාත්‍යාංශයට ඉදිරිපත් කිරිම පිළිබඳව විගණනය වෙත පිළිගත හැකි ප්‍රමාණවත් තොරතුරු ඇගයීම් සිදුකල හැකි පරිදි නියමිත කාල වකවානුව තුල ඉදිරිපත් නොවුණු අතර, එම ඉලක්කයන් සඳහා අමාත්‍යාංශයේ අනුමැතිය ලැබුණේ ද යන්න ද තහවුරු නොවීය. ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ඉදිරිපත් කරන ලද කාර්තුමය ප්‍රගතිය සහ වර්ෂ | .2022 වර්ෂයේ කාර්තු හතර සඳහා කළුතර දිස්ත්‍රික්කයට අයත් සියළුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල ඉලක්ක ලබා ගෙන, එක් එක් කාර්තු අවසානයේ දී ප්‍රගතිය වාර්තා කර ගන්නා ලද අතර ඒ අනුව 2022 වර්ෂයේ ඉලක්කයන් | මහජනතාවට වැඩි සේවාවක් ඉටුකළ හැකි නිවැරදි කාර්ය සාධක දර්ශක හඳුනාගත යුතු බව හා අනුමත ඉලක්ක හා ප්‍රගතිය පිලිබද ප්‍රමාණවත් තොරතුරු ඇගයීම් සිදුකල හැකි පරිදි නියමිත කාල වකවානුව තුල |

| | | |
|---|---|---|
| අවසානයට ඉදිරිපත් කරන ලද ප්‍රගතිය එකිනෙකට වෙනස් වීම, කිසියම් සේවාවක ඉලක්කය ඉදිරිපත් කිරීමේදී ඒවා සංඛ්‍යාත්මකව ඉදිරිපත් කළ යුතු බව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත නිශ්චිතව දක්වා නොතිබීම හා තාත්වික දර්ශක හඳුනාගෙන නොතිබීම ආදී හේතුමත දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2022 වර්ෂය සඳහා වූ කාර්ය සාධන දර්ශක හඳුනාගැනිම, ඉලක්ක පිහිටුවීම හා ළඟා කර ගැනීම හා ඒවායේ ප්‍රගතිය වාර්තා කිරීම, මැන බැලිම, ඇගයීම හා විතැන්වීම සම්බන්ධව පසු විපරම් කිරීමේ ක්‍රියා පටිපාටිය අපේක්ෂිත මට්ටමින් ඉටුවී නොතිබුණු බව විගණනයට නිරීක්ෂණය විය. | වල ප්‍රගතිය වාර්තා කර ඇති බව. | ඉදිරිපත්කල යුතු බව. |

## 6. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරි අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | -------------------------------- | ----------- |
| (අ) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ඇමුණුම 02 ආකෘතිය ප්‍රකාරව 2022 වර්ෂය වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා පිළියෙල කළ මානව සම්පත් සැලැස්ම විගණනයට ඉදිරිපත් නොවීය. | 2022 වර්ෂය සඳහා පුහුණු සැලැස්මක් සකස් කොට ඇති නමුත් එය 2/2018 චක්‍රලේඛය ප්‍රකාරව සකස් කර නොමැති බව හා 2023 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්ම 2/2018 චක්‍රලේඛය ප්‍රකාරව සකස් කර ඇති බව. | චක්‍රලේඛ ප්‍රකාරව මානව සම්පත් සැලැස්ම පිළියෙල කර විගණනයට ඉදිරිපත් කල යුතුය. |
| (ආ) | ඒකාබද්ධ සේවාවන්හි නිලධරයන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියේ 2.2.2 අනුව එකම සේවා ස්ථානයක වසර 05 කට වැඩි කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් ස්ථාන මාරුවීම් වලට යටත් වන බව දක්වා තිබුණ ද දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා නියැදි පරීක්ෂාවට ලක්වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල පහත 2022 දෙසැම්බර් 31 දිනට සේවා කාලය වසර 05 ඉක්ම වූ නිලධාරීන් 256 දෙනකු සේවය කරන බව විගණනයට නිරීක්ෂණය විය. | වර්ෂ 05 ඉක්මවා එකම ස්ථානයක සේවයෙහි යෙදී සිටින ඒකාබද්ධ සේවාවන්හි සියළුම නිලධාරීන් සම්බන්ධයෙන් සම්පූර්ණ තොරතුරු වාර්ෂිකව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කරනු ලබන බව හා දෙපාර්තමේන්තු වාර්ෂික ස්ථාන මාරු මණ්ඩල මගින් උපරිම සේවා කාලයක් සහිත නිලධාරීන් ස්ථාන මාරු කිරීමට හැකි සෑම විටම පියවර ගනු ලබන බව. | ස්ථාන මාරු ප්‍රතිපත්තියට අනුව වාර්ෂික ස්ථාන මාරුවීම් සිදු කළයුතු බව. |